# ඉතාමත්ම ලාභදායක ගව ආහාරය වන තණකොළ වලින් උපරිම ප්‍රයෝජන ගන්නා අන්දම

තණකොළ ස්වාභාවික ගව ආහාරයකි. ඒවාගේම ඉතාමත්ම ලාභදායක ගව ආහාරය ද වේ. අද දින වෙනත් ගව ආහාර වර්ගවල මිල ඉහළ යෑම නිසාත්, සැපයීමේ ඇති අඩු ලුහුඬුකම් වලට මූණපෑමට තිබෙන නිසාත්, තණකොළ වලින් හැකිතාක් ප්‍රයෝජනය ගැනීමට කිරි පට්ටි පාලකයන් විසින් කළ යුතුව තිබේ.

තණකොළ වලින් උපරිම ප්‍රයෝජනය ගැනීම සඳහා කිරි පට්ටි පාලකයන් විසින් දැන ගතයුතු කරුණු මෙසේය. (1) තමා විසින් වගා කළ යුතු සුදුසු තෘණ වර්ග. (2) මෙම තෘණ වර්ග වලින් අධික අස්වැන්නක් ලබා ගන්නා අන්දම. (3) උපරිම පෝෂ්‍ය ගුණය ලබාගැනීමට තණ කොළ කපා ගතයුතු අවස්ථාව. (4) අතිරේක ආහාරයක් වශයෙන් දිය යුතු සාන්ද්‍ර ආහාර ප්‍රමාණය.

## වගාකළ යුතු සුදුසු තෘණ වර්ග

අඩි 4,000ට ඉහළ උඩරට ප්‍රදේශයේ වගා කිරීමට නිර්දේශ කරන්නේ කිකියු නැමැති තණ කොළ වර්ගය වේ. අඩි 1,000 – 4,000ත් අතරේ මැදරට තෙත් කලාපයට සිග්නල් තණ හෙවත් බ්‍රැකේරියා බ්‍රිසන්තා සහ රුසී තණ හෙවත් රුසීසිඑන්සිස් නැමැති තණ වර්ග දෙක ද, තෙල්දෙණිය, කුණ්ඩසාලේ සහ නාලන්ද, ප්‍රදේශ ඇතුළත්වන මැදරට වියළි කලාපයට සිග්නල් තණ සහ ගිණි තණ නිර්දේශ කරනු ලැබේ. අඟල් 60ට වඩා වර්ෂාපතනයක් ලැබෙන පහතරට තෙත් කලාපයට සිග්නල් තණ, රුසි තණ, ගිනි තණ සහ දෙමුහුන් නේපියර් නැමැති තෘණ වර්ග යෝග්‍ය වන අතර අඟල් 60ට වඩා වර්ෂාපතනය ඇති, පොල් ත්‍රිකෝණයට කෝරි තණ හෙවත් බ්‍රැකේරියා මිලිෆෝර්මිස්, ගිනි තණ සහ දෙමුහුන් නේපියර් යන තණ වර්ග අනුමත කෙරේ.

## සටහන් කිරීම

අඩි 4,000ට ඉහළ උඩරට ප්‍රදේශයේ වතුර රඳා පවතින මුඩු බිම්වලට පැස්පලම් උර්විලයි නැමැති වර්ගයත්, දිය සීරාව බැස නොයන වතුර රඳා පවතින සෙසු ඉඩම් වලට බ්‍රැකේරියා මියුටිකා හෙවත් දිය තණකොල වගා කිරීමට නිර්දේශ කරනු ලැබේ.

## අධික අස්වැන්නක් ලබා ගන්නා අන්දම

තණ කොළ නිතිපතා චක්‍රයක් අනුව කපා ගැනීමටත් හා තණ භූමිය හොඳින් නඩත්තුවීමටත් ගව ගාලෙන් තමන්ට එකතු කරගත හැකි ගොම සහ ගව මූත්‍රා වලින් නිතිපතා පොහොර කළ යුතුය. මෙම පොහොර වලට අමතර හය මසකට වරක් සුපර් පොස්පේට් කිලෝග්‍රෑම් 25ක් සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 25ක් බැගින් ද, අවුරුද්ද මුළුල්ලේ මාස දෙකකට වරක් යූරියා කිලෝ ග්‍රෑම් 25ක් බැගින් ද තණ භූමියට යෙදීම මැනවි.

## තණ කොළ කපා ගත යුතු වේලාව

තෘණ වල උපරිම පෝෂ්‍ය ගුණය ලබාගැනීම සඳහා මල් පිපීමට පෙර සති 4 – 6 අතරේ තණ කොළ කපා ගත යුතුය. මීට වඩා පමා කළොත් තණ කොළ මෝරන හෙයින් එහි රළු භාවය වැඩිවන නිසා දෙනුන් ඒවා ප්‍රතික්ෂේප කරනු ඇත.

**සාන්ද්‍ර ආහාර ප්‍රමාණය**

කිරි දෙනුන්ට සැපයිය යුතු සාන්ද්‍ර ආහාරය, කිරි දෙනගේ බර, ඌ විසින් සපයන කිරි ප්‍රමාණය, කියෙන තණ කොළ හා එහි පෝෂ්‍ය ගුණය යන කරුණු අනුව වෙනස්විය හැකිය.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් සැපයූ, මෙයට යාකර තිබෙන චක්‍ර වලින් (1) තරාදියක් නැතුව සතෙකුගේ බර ප්‍රමාණය නිගමණය කිරීම හා (2) සැපයීමට හැකි තණ කොළ ප්‍රමාණය ද එහි පෝෂ්‍ය ගුණය හා නිෂ්පාදනය වන කිරි ප්‍රමාණය අනුව සමබර තණ කොළ හා සාන්ද්‍ර ආහාර ප්‍රමාණය දැනගන්නා අන්දමත් ගැන විස්තර පෙන්වා ඇත.

උදාහරණයක් වශයෙන් එළදෙනකුගේ පපුවේ වට ප්‍රමාණය අඟල් 65ක් වන්නේ නම් උගේ බර රාත්තල් 815ක් පමණ වේ (1 වැනි චක්‍රය බලන්න). පපුවේ වට ප්‍රමාණය මැන ගැනීමට සාමාන්‍ය ටේප් පටියකින් කළ හැකිය. ඉස්සරහ කකුල් දෙකට හා උරපතුවලට පිටුපසින් දෙනගේ පපුව වටේ ටේප් පටිය යන්තම් තදකර ඇල්ලීමෙන් වට ප්‍රමාණය බලාගත හැක.

මෙම ගවදෙන දිනකට කිරි පයින්ට් 20ක් ලබා දෙන්නේ නම් දිනකට හොඳ තණ කොළ රාත්තල් 100ක් කනු ලැබේ. මෙම තණ සෑම සති 4 – 6 කට වරක් කපා කන්ට දෙන ඒවා නම් මෙම කිරි දෙනට දියයුතු සාන්ද්‍ර ආහාර ප්‍රමාණය රාත්තල් 6ක් වේ.

අනිත් අතින් බලන කල එම ගව දෙනට කිරි පයින්ට් 20ක් ලබා දීමට වල් පැල සමඟ මිශ්‍රවූ මේරූ තණ කොළ රාත්තල් 80ක් දෙනු ලබයි නම් සාන්ද්‍ර ආහාර වශයෙන් පෙරකී ප්‍රමාණය මෙන් 2 1/2 ගුණයක් හෝ රාත්තල් 15ක් ලබාදීමට අවශ්‍ය වේ (2 වැනි චක්‍රය බලන්න).

1 වැනි චක්‍රය—පපුවේ වට ප්‍රමාණය අනුව තක්සේරු කරන ලද බර

| පපුවේ වට ප්‍රමාණය (අඟල්) | බර (රාත්තල්) | පපුවේ වට ප්‍රමාණය (අඟල්) | බර (රාත්තල්) | පපුවේ වට ප්‍රමාණය (අඟල්) | බර (රාත්තල්) |
|---|---|---|---|---|---|
| 30.0 | 100 | 51.0 | 414 | 72.0 | 1,064 |
| 30.5 | 103 | 51.5 | 424 | 72.5 | 1,085 |
| 31.0 | 107 | 52.0 | 434 | 73.0 | 1,104 |
| 31.5 | 112 | 52.5 | 445 | 73.5 | 1,126 |
| 32.0 | 117 | 53.0 | 456 | 74.0 | 1,146 |
| 32.5 | 121 | 53.5 | 467 | 74.5 | 1,169 |
| 33.0 | 127 | 54.0 | 476 | 75.0 | 1,191 |
| 33.5 | 131 | 54.5 | 495 | 75.5 | 1,213 |
| 34.0 | 137 | 55.0 | 510 | 76.0 | 1,236 |
| 34.5 | 141 | 55.5 | 521 | 76.5 | 1,263 |
| 35.0 | 146 | 56.0 | 534 | 77.0 | 1,285 |
| 35.5 | 152 | 56.5 | 545 | 77.5 | 1,308 |
| 36.0 | 157 | 57.0 | 562 | 78.0 | 1,331 |
| 36.5 | 162 | 57.5 | 577 | 78.5 | 1,354 |
| 37.0 | 167 | 58.0 | 590 | 79.0 | 1,377 |
| 37.5 | 173 | 58.5 | 605 | 79.5 | 1,400 |
| 38.0 | 179 | 59.0 | 616 | 80.0 | 1,423 |
| 38.5 | 186 | 59.5 | 629 | 80.5 | 1,446 |
| 39.0 | 193 | 60.0 | 647 | 81.0 | 1,469 |
| 39.5 | 199 | 60.5 | 668 | 81.5 | 1,492 |
| 40.0 | 206 | 61.0 | 684 | 82.0 | 1,515 |
| 40.5 | 214 | 61.5 | 700 | 82.5 | 1,538 |
| 41.0 | 223 | 62.0 | 716 | 83.0 | 1,561 |
| 41.5 | 229 | 62.5 | 732 | 83.5 | 1,584 |
| 42.0 | 239 | 63.0 | 748 | 84.0 | 1,607 |

**1 වැනි වගුව—පපුවේ වට ප්‍රමාණය අනුව තක්සේරු කරන ලද බර—(සම්බන්ධයි)**

| පපුවේ වට ප්‍රමාණය (අඟල්) | බර (රාත්තල්) | පපුවේ වට ප්‍රමාණය (අඟල්) | බර (රාත්තල්) | පපුවේ වට ප්‍රමාණය (අඟල්) | බර (රාත්තල්) |
|---|---|---|---|---|---|
| 42.5 | 247 | 63.5 | 762 | 84.5 | 1,629 |
| 43.0 | 255 | 64.0 | 778 | 85.0 | 1,650 |
| 43.5 | 270 | 64.5 | 790 | 85.5 | 1,673 |
| 44.0 | 283 | 65.0 | 815 | 86.0 | 1,692 |
| 44.5 | 293 | 65.5 | 828 | 86.5 | 1,718 |
| 45.0 | 298 | 66.0 | 848 | 87.0 | 1,741 |
| 45.5 | 307 | 66.5 | 866 | 87.5 | 1,764 |
| 46.0 | 315 | 67.0 | 883 | 88.0 | 1,788 |
| 46.5 | 323 | 67.5 | 891 | 88.5 | 1,812 |
| 47.0 | 334 | 68.0 | 904 | 89.0 | 1,833 |
| 47.5 | 344 | 68.5 | 923 | 89.5 | 1,857 |
| 48.0 | 354 | 69.0 | 942 | 90.0 | 1,881 |
| 48.5 | 364 | 69.5 | 962 | 90.5 | 1,905 |
| 49.0 | 374 | 70.0 | 982 | 91.0 | 1,929 |
| 49.5 | 384 | 70.5 | 1,002 | 91.5 | 1,952 |
| 50.0 | 394 | 71.0 | 1,022 | 92.0 | 1,975 |
| 50.5 | 404 | 71.5 | 1,043 | — | — |

**2 වැනි වගුව—තණ කොළ ප්‍රමාණය හා එහි පෝෂ්‍ය ගුණය අනුව කිරිදෙනුන්ට අවශ්‍ය සාන්ද්‍ර ආහාරය සැපයිය යුතු මඟ පෙන්වන සටහණ**

| ජීව බර (රාත්තල්) | 700 | | | | | | | | 800 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදනය (පයින්ට) | 1 | | 2 | | 3 | | 4 | | 1 | | 2 | | 3 | | 4 | |
| (සාන්ද්‍ර ආහාර රාත්තල්) | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි |
| 0 | 2 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 3 | 0 | 2 | 0 | 2 | 0 | 0 | 0 |
| 5 | 6 | 2 | 5 | 1 | 5 | 1 | 2 | 0 | 6 | 3 | 5 | 2 | 5 | 2 | 3 | 0 |
| 10 | 8 | 5 | 8 | 4 | 8 | 4 | 5 | 0 | 9 | 6 | 8 | 4 | 8 | 4 | 6 | 0 |
| 15 | 11 | 8 | 10 | 6 | 10 | 6 | 8 | 2 | 12 | 9 | 11 | 7 | 11 | 7 | 9 | 3 |
| 20 | 14 | 11 | 13 | 9 | 13 | 9 | 11 | 5 | 15 | 11 | 14 | 10 | 14 | 10 | 11 | 6 |
| 25 | 17 | 14 | 16 | 12 | 16 | 12 | 14 | 8 | 18 | 14 | 17 | 13 | 17 | 13 | 14 | 9 |
| 30 | 20 | 16 | 19 | 15 | 19 | 15 | 16 | 11 | 21 | 17 | 20 | 16 | 20 | 16 | 17 | 11 |
| 35 | 23 | 19 | 22 | 18 | 22 | 18 | 19 | 14 | 23 | 20 | 22 | 19 | 22 | 19 | 20 | 14 |
| ගැබ කාලය (අවසාන මාස 2) | 10 | 6 | 9 | 5 | 9 | 5 | 6 | 0 | 10 | 7 | 9 | 5 | 9 | 5 | 7 | 1 |

**සංඥා පද මඟ පෙන්වීම :**

1. වල් පැල මිශ්‍රවූ මේරූ තණ.
2. පෝර නොකරන ලපටි තණ සති 4 – 6 කට වරක් උලා කෑමට දීම.
3. පෝර කරන ලද තණ කපා කෑමට දීම/උලා කෑමට දීම සති 6කට පසු.
4. පෝර කරන ලද තණ කපා කෑමට දීම/උලා කෑමට දීම සති 4 – 6කට වරක්.

අඩු — තණ කොළ රා. 60 අනුභව කරන ලද (රා. 80ක් සැපයීම).
වැඩි — තණ කොළ රා. 100 අනුභව කරන ලද (රා. 120ක් සැපයීම).

**සාන්ද්‍ර පිළිබඳ විස්තර :**

1. ප්‍රෝටීන් — 14 – 16%.
2. ටී. ඩී. එන්. (ජීර්ණ කළ හැකි මුළු පෝෂ්‍ය පදාර්ථ) — 65 – 70% (පොල් පුන්නක්කු කොටස් දෙකයි සහල් නිවුඩු කොටස් එකයි මිශ්‍ර කිරීමෙන්) ඛනිජ අමතරව.

**2 වැනි චක්‍රය—තණ කොළ ප්‍රමාණය හා එහි පෝෂ්‍ය ගුණය අනුව කිරි දෙනුන්ට අවශ්‍ය සාන්ද්‍ර ආහාර සැපයිය යුතු මග පෙන්වන සටහන**

| ජීව බර (රාත්තල්) | 900 | | | | | | | | 1,000 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදනය (පයින්ට) | 1 | | 2 | | 3 | | 4 | | 1 | | 2 | | 3 | | 4 | |
| (සාන්ද්‍ර ආහාර රාත්තල්) | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි | අඩු | වැඩි |
| 0 | 4 | 0 | 3 | 0 | 3 | 0 | 1 | 0 | 5 | 2 | 4 | 0 | 4 | 0 | 2 | 0 |
| 5 | 7 | 4 | 6 | 2 | 6 | 2 | 4 | 0 | 8 | 4 | 7 | 3 | 7 | 3 | 4 | 0 |
| 10 | 10 | 6 | 9 | 5 | 9 | 5 | 6 | 1 | 11 | 7 | 10 | 6 | 10 | 6 | 7 | 1 |
| 15 | 13 | 9 | 12 | 8 | 12 | 8 | 9 | 4 | 13 | 10 | 13 | 9 | 13 | 9 | 10 | 4 |
| 20 | 16 | 12 | 15 | 11 | 15 | 11 | 12 | 6 | 16 | 13 | 15 | 11 | 15 | 11 | 13 | 7 |
| 25 | 18 | 15 | 18 | 14 | 18 | 14 | 15 | 9 | 19 | 16 | 18 | 14 | 18 | 14 | 16 | 10 |
| 30 | 21 | 18 | 20 | 16 | 20 | 16 | 18 | 12 | 22 | 19 | 21 | 17 | 21 | 17 | 19 | 13 |
| 35 | 24 | 21 | 23 | 19 | 23 | 19 | 21 | 15 | 25 | 21 | 24 | 20 | 24 | 20 | 21 | 16 |
| ගැබ් කාලය (අවසාන මාස 2) | 12 | 8 | 11 | 7 | 11 | 7 | 8 | 3 | 13 | 10 | 12 | 8 | 12 | 8 | 10 | 4 |

**සාන්ද්‍ර පිළිබඳ විස්තර :**

1. ප්‍රෝටීන් — 14 – 16%.

2. ටී. ඩී. එන්. (ජීර්ණ කළ හැකි මුළු පෝෂ්‍ය පදාර්ථ) — 65 – 70% (පොල් පුන්නක්කු කොටස් දෙකයි සහල් නිවුඩු කොටස් එකයි මිශ්‍ර කිරීමෙන්) ඛනිජ අමතරව.

**සංඥා පද මග පෙන්වීම :**

1. වල් පැල මිශ්‍රවූ මේරූ තණ.
2. පෝර නොකරන ලපටි තණ සති 4 – 6 කට වරක් උලා කෑමට දීම.
3. පෝර කරන ලද තණ කපා කෑමට දීම/උලා කෑමට දීම සති 6කට පසු.
4. පෝර කරන ලද තණ කපා කෑමට දීම/උලා කෑමට දීම සති 4 – 6 කට වරක්.

අඩු — තණ කොළ රා. 60 අනුභව කරන ලද (රා. 80ක් සැපයීම).

වැඩි — තණ කොළ රා. 100 අනුභව කරන ලද (රා. 120ක් සැපයීම).

✶ ✶ ✶ ✶ ✶

වැඩි පෝෂ්‍ය ගුණයක් ඇති තණ වර්ගයක් වගාකර ගවයින්ට කෑමට දීමෙන් සාන්ද්‍ර ආහාර දීම අඩුකර ගත හැක